**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

# ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP)

THE WORLD BANK

# ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියක් වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව එක්ව අරමුදල් සපයයි. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 103 ක් වන අතර, ගොවිපොළෙහි සිට පාරිභෝගිකයා දක්වා වන අගයදාමය තුළ හඳුනාගත් ගැටලුවලට පිළියම් සෙවීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර සහ වැවිලි යන ක්ෂේත්‍රයන්හි නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාවසායකයින්ට සහයවීමට මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයන්හි සිටින කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායීතාව, තරගකාරීත්වය සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව ඉහළනැංවීම මෙම පස් අවුරුදු ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු (01 හා 02) සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවයි. එක් එක් තනතුර සඳහා වන වැටුප් පරිමාණය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 සහ 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛය පරිදි වේ.

| අංකය | වැටුප් කාණ්ඩය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | PS1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |
| 02 | PS3 | මූල්‍ය කළමනාකරණ විශේෂඥ | 01 |

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද:**

අයදුම්පත් බාරගන්නා අවසන් දිනය වන විට අයදුම්කරුවන් විසින් අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි සඳහන් මූලික සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධයෙන් වන අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුවේ.

**පොදු කොන්දේසි :**

- වයස් සීමාව – අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු හැටදෙකට (62) නොවැඩි විය යුතුය.
- විදේශාධාර ව්‍යාපෘතියක ඉහළ හෝ සමාන තනතුරක සේවා පළපුරුද්දක් තිබීම.
- ප්‍රසම්පාදන, ගිණුම්කරණය, ව්‍යාපාර හා අගයදම සංවර්ධනය, අලෙවිකරණය, සැපයුම් කළමනාකරණය, වැව් ප්‍රතිසංස්කරණය, 4P ව්‍යාපාර සංකල්පය සහ එල්ලංගා පද්ධති කළමනාකරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, පරිගණක සාක්ෂරතාවය සහ රජයේ නීතිරීති සහ රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් තිබීම.
- අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තීය නිපුනතාවය අමතර සුදුසුකමක් වනු ඇත.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවාගැනීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.
- බඳවාගැනීම් සම්බන්ධයෙන් වන ඕනෑම ආකාරයක අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

**අයදුම්පත් :**

ජීව දත්ත තොරතුරු සහ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (two non-related referees) තොරතුරු ඇතුළත් අයදුම්පත සමග සියලුම සහතිකවල පිටපත් අමුණා 2025 මැයි 04 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල මඟින් එවීමට හෝ **irdcrppmu@gmail.com** විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුවේ.

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,**
**අංක 80/5, "ගොවිජන මන්දිරය",**
**රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.**

අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

වැඩිදුර තොරතුරු සහ විස්තරාත්මක දැන්වීම සඳහා **http://www.agrimin.gov.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**